# සති පාසල කාර්‍ය පත්‍රිකාව

**1. නිපුණතාව 4.0 :** නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම 4.1 :** දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසාංගික ලක්ෂණ හඳුනා ගනියි.

**පාඩම :** දේශීය නාට්‍යය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර අවස්ථා අධ්‍යයනය

## 2.ශිෂ්‍යයා විසින් කල යුතු කාර්යයන්:

- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.

- දොරකඩ අස්න සම්බන්ධයෙන් තොරතුරු එක් රැස් කිරීම.

- පහත දී ඇති ඉගෙනුම් පත්‍රිකා හා අනෙකුත් ඉගෙනුම් ආධාරක ඇසුරෙන් දි ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන්න.

- පාසල ආරම්භයේදී ඔබගේ අනාවරණයන් පන්තිය ඉදිරියේ ඉදිරිපත් කරන්න.

**3.ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත, කියවීම් පත්‍රිකා, Websites සහ ඉගෙනුම් ආධාරක :-**

- **eතක්සලාව -**
  https://www.e-thaksalawa.moe.gov.lk/web/en/

- **eනැණපියස -**
  course : 09 ශ්‍රේණිය නාට්‍ය හා රංගකලාව
  https://enenapiyasa.lk/

- **You Tube-**

දොරකඩඅස්න
https://youtu.be/RsmR49Phs2w

පිරිත්පිංකම
https://youtu.be/VmGBGEdO3Xg

- **කියවීම් පත්‍රිකාව -**

**දොරකඩ අස්න**

මෙහි කතාව වන්නේ සති පිරිත අවසානයේ ලිරිත් ඇසීමට දෙවිවරුන්ට ආරධනා කිරීමය. ඉතාමත් ගෞරවාන්විත ව තල් ගොබයක පත් ඉරුවල දේව ආරාධනා ලියා එය සරසනු ලැබූ ලීයක දෙපස රඳවයි. දේව දූතයකු සේ සැරසුන පිරිමි ළමයෙකු පෙරහැරකින් තල්පත් රැගෙන දේවාල වෙත යයි. දේවාලයේ සතර කොන දේව ආරධනා පත් එල්ලූ පසුව පෙරහැර නැවත විහාරය වෙත පැමිණේ.

දේව දූතයා කඩුගත් රැකවලුන් මුර කරන කාමරයක රඳවා තබයි. රාත්‍රී පිරිතට වඩින භික්ෂූන් සමඟ දේව දූතයා පෙරහැරින් පිරිත් මණ්ඩපය වෙත එයි.

දොරටුව ළඟ සිටින දේව දූතයා සහ භික්ෂුක හා සංවාදයේ යෙදේ.(විචිත්‍රවත් සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල බසින් මෙම සංවාදය ඉදිරිපත් කෙරේ)

භික්ෂුවගේ ප්‍රශ්න විචාරීමට අනුව දේව දූතයා දොරකඩ හස්න ශබ්ද නගා කියවයි. දොරකඩ හස්න කියවූ පසු අනුශාසනා ඉදිරිපත් කෙරේ.

මෙහි නාට්‍යමය අවස්ථා -

- අනුකරණය - දේව දූතයෙකු ලෙස හැසිරීම.
- සමාරෝපය - දේව දූතයෙකු ලෙස වෙස් ගැනීම.
- සංවාද භාවිතය - දේව දූතයා හා භික්ෂුව අතර සංවාදය.
- නාට්‍ය උපකරණ භාවිතය - තල් පත කත් ලීයක එල්ලීම.
- ප්‍රේක්ෂකයෝ - පිරිත් ඇසීමට ආ පිරිස
- අංග රචනය - දේව දූතයෙකු ලෙස ඇඳුම් පැළඳුම්වලින් සැරසීම.
- ආලෝකය භාවිතය - පන්දම් එළි භාවිතය
- වේදිකාව - පිරත් මණ්ඩපය

වැනි අවස්ථා සේම ප්‍රාසාංගික ලක්ෂණ ද දැකිය හැකි ය.

**4.මෙම සතියට නියමිත පාඩම මඟින් ආවරණය විය යුතු ඉගෙනුම් එල:**

- නාට්‍ය කලාවේ ඉතිහාසය හඳුනා ගැනීම.
- නාට්‍ය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර හඳුනා ගැනීම.
- දොරකඩ අස්න නම් නාට්‍යමය අවස්ථාවේ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ හඳුනා ගැනීම.

**5.ඇගයීම /තක්සේරුකරණ ක්‍රමවේදය හා ආකෘති:**

1. මෙම පූජා කර්මය පවත්වන්නේ කුමක් අවසානයේද?
2. මෙම බෞද්ධ පූජා කර්මය කෙටියෙන් විස්තර කරන්න.
3. මෙහි ඇතුළත් නාට්‍යම අවස්ථා උදාහරණ සහිතව ලියා දක්වන්න.

සැකසුම :- S.S.C ජයසූරිය

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය